රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක: 01/2008

මගේ අංකය:- ආ/6/4/1/168
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2008 ජනවාරි මස 16 වෙනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රජයේ නිලධාරීන්ගේ සුභසාධක සංගම්වලට**
**රජයේ නිලධාරීන් මුදහැරීම**

ආයතන සංග්‍රහය සංශෝධනය කරමින් නිකුත් කරන ලද 1997.06.30 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/97 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි රජයේ නිලධාරීන්ගේ සුභසාධක සංගම්වලට නිලධාරීන් මුදහැරීමේදී ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 2:3 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් සමඟ මෙම චක්‍රලේඛය මගින් හඳුන්වා දෙනු ලබන ආකෘති පත්‍රයද සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව දන්වමි.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

## සුභ සාධක සංගම් සඳහා මුදහැරීම

01. නිලධාරියාගේ නම :

02. දෙපාර්තමේන්තුව :

03. දැනට දරණ තනතුර සහ ශ්‍රේණිය :

04. තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතද යන වග :

05. ඔහු/ ඇය තනතුරේ ස්ථිර කර ඇද්ද යන බව :

06. රජය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක / තනතුරුවල සම්පූර්ණ සේවා කාලය :

07. උපන් දිනය :

08. යම්කිසි අනිවාර්ය සේවා කාලයක් සඳහා රජයට සේවය කිරීමට ඔහු / ඇය ගිවිසුමකට බැඳී සිටින්නේද යන බව සහ එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :

09. ඔහු / ඇය මුදහැරීමට අදහස් කරන සුභසාධක සංගමය :

10. අදාළ සුභසාධක සංගමයේ සාමාජික සංඛ්‍යාව :

11. සුභසාධක සංගමයේ තනතුර :

12. මුදහැරීම ඉල්ලා සිටින කාලසීමාව :
(නිලධාරියාගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය ඇමිණිය යුතුය)

13. මුදහැරීම ක්‍රියාත්මක වන දිනය / ඉල්ලා සිටින දීර්ඝ කිරීමේ කාලසීමාව :

14. මීට පෙර ඔහු / ඇය වෙනත් සංගමයකට හෝ මෙම සංගමයට මුදහැර ඇද්ද යන්නත්, එසේ නම් ඒ පිළිබඳ විස්තර :

15. අදාළ වෙනත් තොරතුරු :

දෙපාර්තමේන්තු ප්‍රධානියා

(නිල මුද්‍රාව සහිතව)

දිනය :-